# ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය 2006/2007

## ක්ෂේත්‍ර කණ්ඩායම් භාර අධීක්ෂණ නිලධාරියාගේ කාර්යභාරය

ක්ෂේත්‍ර කණ්ඩායම් භාරව ක්‍රියාකරන අධීක්ෂණ නිලධාරියා එම කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨතම සාමාජිකයා ලෙස කටයුතු කළ යුතුය. ඇය තම කණ්ඩායමේ සාමාජිකයන්ගේ සුභ සිද්ධිය සහ ආරක්ෂාව සැලසීම මගින් ඔවුන් රැස්කරන දත්තවල ගුණාත්මකභාවය රැක ගැනීමත් පවරන ලැබූ කාර්ය සාර්ථක කරගැනීමටත් වග බලා ගත යුතුය. ක්ෂේත්‍ර කණ්ඩායම් භාර අධීක්ෂණ නිලධාරියාට කාර්‍ය පවරනු ලබන්නේ සමීක්ෂණයේ අධ්‍යක්ෂක විසිනි. අධීක්ෂණ නිලධාරියා තම කණ්ඩායමේ සාමාජික විමර්ශකවරියන් අතර ක්ෂේත්‍ර කටයුතු නිසි ආකාරව බෙදා දීමට සහ තාක්ෂණිකව සිදු කරනු ලබන නිරීක්ෂණ මගින් ඔවුන් තම රාජකාර්ය නිසි පරිදි ඉටු කරනු ලබන බව තහවුරු කර ගත යුතුය.

## *කණ්ඩායම් භාර අධීක්ෂණ නිලධාරියාගේ කාර්‍යභාරය*

1. සමීක්ෂණය සඳහා තමන්ට පවරනු ලබන ප්‍රදේශයට අදාල සිතියම් සහ නියැදියට තේරෙන ගෘහ කාණ්ඩ අඩංගු ලේඛණය ලබා ගත යුතුය.
2. සමීක්ෂණය සඳහා තමන්ට ලබා දී ඇති ප්‍රදේශය පිළිබඳ මනා දැනුමක් ලබා ගත යුතු අතර සමීක්ෂණ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට අවශ්‍ය වන ප්‍රවාහන පහසුකම් හා කණ්ඩායම් සාමාජිකයන්ගේ නවාතැන් පහසුකම් සංවිධානය කර ගත යුතුය.
3. ප්‍රාදේශීය මට්ටමින් බලධරයන් මෙම සමීක්ෂණය පිළිබඳව දැනුවත් කල යුතු අතර ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.
4. ක්ෂේත්‍ර කටයුතු සාර්ථකව කර ගැනීමට අවශ්‍ය වන මුදල් ප්‍රතිපාදන උපලේඛණ හා වෙනත් පෝරම වර්ග සහ අනෙකුත් උපකරණ යන සියල්ලම අවශ්‍ය පරිදි සපයා ගැනීමට කටයුතු කළ යුතුය.

කණ්ඩායම් අධීක්ෂණ නිලධාරියාගේ සංවිධානය කිරීමේ හැකියාව මත තම කණ්ඩායමේ සමීක්ෂණ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට හැකිවේ. තම කණ්ඩායමේ සම්මුඛ පරීක්ෂකවරියන්ගේ උනන්දුව, ධෛර්‍යය හා කැපවීම උපරිම අයුරින් පවත්වා ගැනීමට අධීක්ෂණ නිලධාරියාට හැකි විය යුතුය. තම කණ්ඩායමේ යම් කිසි ප්‍රශ්නයක් ඇති වුවහොත් ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීමට අධීක්ෂණ නිලධාරියා සතු වගකීමකි.

*ක්ෂේත්‍ර කටයුතු කරගෙන යන අතරතුරේදී අධීක්ෂණ නිලධාරියා පහත කරුණු පිළිබඳව වගකිව යුතුය.*

1. තම කණ්ඩාමේ සාමාජිකාවන් අතර නිසි ආකාරව රාජකාර්ය බෙදාදීම මෙහිදී එම සාමාජිකාවන්ගේ භාෂාමය දැනුම පිළිබඳව සැලකිල්ලට ගත යුතුය.
2. තමන්ට භාරදුන් වැඩ කොටස නිසි පරිදි කෙර ඇත්දැයි බැලීම සඳහා ක්ෂේත්‍ර පාලන වාර්තා සම්පූර්ණ කර ඇත්දැයි බැලීම.
3. සමීක්ෂණ කාණ්ඩයක සමීක්ෂණය අවසන් වූ වහාම සම්පූර්ණ කරන ලද උපලේඛණ සහ ප්‍රගති වාර්තාව ක්ෂේත්‍ර සංස්කාරකගේ නිර්දේශයද සහිතව ප්‍රධාන කාර්යාලයට එවීමට කටයුතු කළ යුතුය. උපලේඛණ මිටි බැදිය යුත්තේ විශේෂිත සමීක්ෂණ කාණ්ඩ මට්ටමිනි. අධීක්ෂණ නිලධාරියාට ලබාදී ඇති පොලිතින් කවර හා ගම් ටේප් මේ සඳහා උපයෝගී කර ගත යුතුය.
4. තම කණ්ඩායම රැඳී සිටින ස්ථාන ක්ෂේත්‍ර සම්බන්ධීකරණ නිලධාරියාට දැනුම් දෙන්න. කිසියම් ප්‍රශ්නයක් තිබේනම් ඒ බවද වාර්තා කරන්න.
5. තම කණ්ඩායමට සපයා ඇති වාහන පිළිබඳව සැලකිලිමත් විය යුතුය.
   එය ක්ෂේත්‍රයේ යැම සඳහා සුදුසු තත්වයෙන් තිබේදැයි නිතිපතා රියදුරු මහතාගෙන් විමසා නිර්දේශය ලබා ගත යුතුය.
   දෛනිකව ගමන් කරන ලද දුර සටහන් කළ යුතු අතර එය එදිනෙදා සම්පූර්ණ කළ යුතුය. එම වාහනය මෙම සමීක්ෂණ කටයුතු සඳහා පමණක්ම භාවිතා කළ යුතු බවට වග බලා ගත යුතුය.
6. තම කණ්ඩායමේ සාමාජිකයන්ගේ කණ්ඩායම් හැඟීම රැක ගන්නා පරිදි තම දෛනික කටයුතු සමීක්ෂණ කාලය පුරාම සංවිධානය කර ගත යුතුය.

# විශේෂයෙන් සැලකිලිමත් විය යුතු කරුණු

- අනිවාර්යයෙන්ම ක්ෂේත්‍ර සංස්කාරවරයා මුණගැසී ඔහු සහතික කළ උපලේඛන කිහිපයක් පරීක්ෂාවට ලක් කළ යුතුය.
- නියැදියට තේරී ඇති නිවාස ඒකකම සමීක්ෂණයට භාජනය කර ඇත්දැයි සොයා බැලීම. (අහඹු ලෙස නිවාස 5 ක් පරීක්ෂාවට ලක් කිරීම සුදුසු වේ.)
- නැවත වාරයක් සමීක්ෂණය සඳහා යා යුතු ගෘහ ඒකකවලින් තොරතුරු ලබා ගැනීමට අපහසු අවස්ථා වලදී ඒ සඳහා මැදිහත් වී එම තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.
- සැක සහිත අවස්ථා වලදී නැවත පරීක්ෂාවලට ලක් කිරීම මගින් නිවැරදිතාවය තහවුරු කිරීම. එනම් අන්ත වයස් කාණ්ඩවල සිටින සුදුසු කාන්තාවන් සමීක්ෂණයට භාජනය කිරීම පිළිබඳව නිරවද්‍ය බව තහවුරු කිරීම. ( විශේස වයස් වනුයේ 15, 49, අවුරුදු 6 ට අඩු දරුවන්)
- මිය ගිය දරුවන් සිටී නම් ඒවා නිවැරදිව 2 කොටසේ ඇතුලත් කර ඇත්දැයි පරීක්ෂා කිරීම. යම් විශේෂ කාණ්ඩයක් සඳහා එක් මිය ගිය දරුවකු හෝ නොසිටී නම් එහි නිරවද්‍යතාවය පිළිබඳව සැකයක් මතුවිය හැකි බැවින් ඒ පිළිබඳව පරීක්ෂාකාරී විය යුතුය. විශේෂයෙන්ම සුනාමියෙන් විනාශ වූ ප්‍රදේශ වලට මෙය වැදගත් වේ.
- නිවුන් දරුවන් සිටී නම් ඔවුන් 2 කොටසේ නිරවද්‍යව ඇතුලත් කර ඇත්දැයි පරීක්ෂා කිරීම.
- නිවුන් දරුවන්ගෙන් එක් අයෙක් මියගොස් නම් ජීවත්වන දරුවා බාලම දරුවා ලෙස ගත යුතුය.
- 2 කොටසේ උපත් වගුවේ දරුවාට අදාල පේලි අංකය 4 හා 5 කොටස් වල දී සඳහන් කර ඇත්දැයි බැලීම.
- උපත් පරතරය නිරවද්‍යදැයි පරීක්ෂාවට භාජනය කිරීම.
- ප්‍රශ්න අංක 120 හි සඳහන් වර්ෂය හා මාසය 2 කොටසේ උපත් වගුවේ පලවන උපත අතර පරතරය මාස 9 ක් හෝ ඊට වැඩි විය යුතු අතර පරතරය මාස 7 හෝ 8 නම් එය නිවැරදි බව තහවුරු කර සම්මුඛ පරීක්ෂකවරියන්ගේ සටහන් එහි යොදා තිබිය යුතුය. බිය මාස 6 ට අඩු නම් දෝෂයක් ඇති බැවින් එය නිවැරදි කිරීමට අවශ්‍ය වේ.
- ප්‍රශ්න අංක 462, 465A හා 470 අතර ගැලපුම පරීක්ෂාවට ලක් කළ යුතුය. එනම් පලමු මාස 4 තුලදී මව් කිරි පමණක් දී ඇත්නම් අමතර ආහාර මුලින්ම දීම මාස 5 හෝ ඊට වැඩි අගයක් ගත යුතු වේ.
- ලුණු පරීක්ෂාවට භාජනය කළ යුත්තේ වැඩියෙන්ම භාවිතා කරන ලුණු වර්ගයට අදාලව නමුත් සමහර අවස්ථා වලදී වැඩියෙන්ම භාවිතා කරන ලුණු වර්ගය ගෘහයේ නැති අවස්ථා හමුවේ. මෙවිට අනෙක් ලුණු වර්ගය භාවිතා කර පරීක්ෂණය කර ප්‍රතිඵල සටහන් කිරීම නොකළ යුතු බව කණ්ඩායම් වල අධීක්ෂණ නිලධාරී ඇතුළු සම්මුඛපරීක්ෂකවරියන් දැනුවත් විය යුතුය.
- සමහර ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී දෙනු ලබන පිළිතුරට අදාලව කේතය කව කළ හැකි විටදී වෙනත් යටතේ ලියන අවස්ථා ඇත. මෙය නැවතත් කාර්යාලයේ සංස්කරණය කළ යුතු බැවින් පිළිතුරට අදාල කේතය කව කිරීමට වග බලා ගත යුතු බව කණ්ඩායම් සාමාජිකාව දැනුවත් කළ යුතුය.

අධ්‍යක්ෂ

DHS ඒකකය